කරගෙන යනව නම් කොතන වැඩ කළත් ප්‍රශ්නයක් නැහැ මදාරා..” මදාරා විදුල සමග ඊයේ දුරකතනයෙක් කතා කළ වේලාවේ ඔහු කීවේ ය. ඔහු කියන්නේ සැබෑවකි. අනෙක් අතට තමා මේ ගමන කොතැනකින් හෝ ඇරඹිය යුතු ය.

මදාරා නගර ශාලාව අසළ දී බසයෙන් බැස්සා ය. මෙතැන සිට විනාඩි පහක පා ගමනකින් විදුල ගේ කාර්යාලයට යා හැකි ය. තමාට රැකියාව ලැබුණ බව දුරකතනයෙන් ඔහුට කියනවාට වඩා මුණගැසී කීම සුදුසු යයි සිතුණේ මන්දැයි ඇය ම නොදත්තා ය. හමු වී කීම ඔහුට කරන ගෞරවයක් වනු ඇතැයි දැන් ඇයට සිතෙයි.

කාර්යාලයෙන් පිටවී සිය වාහනයට ඇවිද යමින් සිටි විදුල මදාරා දැක නැවතුණේ ය. මේ මොහොතේ ඇය මෙහිදී හමුවන්නට ඔහු බලාපොරොත්තු නොවී ය. ඔහු මවිතයෙන් මෙන් ඇය දෙස බලා සිටියේ එනිසා ය. මදාරා ඈත තියාම ඔහු හා සිනාසුණා ය.

“මාව සිලෙක්ට් කරගත්තා...” ඈ කීවා ය.

“මං දන්නවා.. ” ඔහු කීවේ ය. “.. සිසිර මට දැන් ටිකකට කලින් කිව්වා.. කන්ග්‍රැජුලේෂන්ස්..” ඔහු දිගු කළ සුරතට ඇගේ සුරත හමුවිය. ඇගේ අත අසාමාන්‍ය ලෙස සියුමැළි යයි ඔහුට සිතුණි. “.. යමු... යන ගමන් කතා කරමු..” ඔහු ඇයට නගින්නට රියේ වම්පස ඉදිරි දොර ඇරදුන්නේ ය. යන්නේ කොතැනටදැයි කියාවත් නොඅසා ම ඇය වාහනයට ගොඩ වූවා ය.

“මට ආදිවාසීන් ගැන ප්‍රොජෙක්ට් එකක් බාර දෙනවා කිව්වා..” ඔහු පටු මාවතෙන් මහපාරට වාහනය හරවන අතර ඈ කීවා ය. එය ද ඔහුට අලුත් ආරංචියක් නොවන බව ඔහුගේ මුහුණින් ඈ දුටුවා ය. “.. මට බයත් එක්ක.. හරියට කරගන්න පුලුවන් වෙයිද කියලා..”

ඔහු නිමේෂයකට හිස හරවා ඇය දෙස බැලුවේ ය.

“මං උදව් කරන්නං.. ඔය කාරණායටම අදාලව ආදිවාසීන් ගැන මං කරපු ඩොක‍යුමන්ට්‍රි එකකුත් තියෙනවා.. මං ඒකත් ඔයාට දෙන්නං.. ඒකෙනුත් යමක් ඔයාට ගන්න පුලුවන් වෙයි..” ඔහු කීවේ ය. “.. සමහරු නම් කරන්නෙ බොරුවම තමයි.. ඔයා දන්නවද..? ජීවිතේට වැද්දෙක් මුණ නොගැහුණ මිනිස්සුත් ආදිවාසීන් ගැන රිසර්ච් පේපර්ස් ලියලා තියෙනවා.. පිටරට මිනිස්සු රවට්ටලා සල්ලි ගන්න ක්‍රමය ඒ මිනිස්සු දන්නවා.. ඒත් මදාරා ඔයා කරන වැඩේ හරියටම කරන්න.. සල්ලි ගැන නෙවෙයි.. ඒ වැඩෙන් තමන්ට ලැබෙන ස්වයංතෘප්තිය ස්වයංවර්ධනය ගැන හිතන්න.. කරන වැඩේ හරියටම කරන්න.. ඒ විදියට ලබා ගන්නා කීර්තිනාමය හැමදාම පවතිනවා..”

“සර්ල මට මගේ ජීවිතය ආපහු හොයලා දුන්නා.. අතරමං වෙලා හිටිය මගේ පාර නිවැරදි කරලා දුන්නා.. ඒක මගේ හිතෙන් මැකෙන්නෙ නෑ.. සර් අද මේ මට කරන උපකාර වෙනුවෙන් මට කරන්න පුලුවන් ඕනෙම දෙයක් කරන්න මං පසුබට වෙන්නෙ නෑ.. මං කොහොම හරි මේ ගමන යනවා.. ඉස්සරහටම යනවා..” මදාරා හෙලූ කෘතඥතාපූර්වක බැල්ම ඉදිරිය බලාගෙන වාහනය පදවමින් සිටි විදුල නොදුටුවේ ය. මදාරා ගේ වදන් පමණක් ඔහුට ඇසුණි.

0000

සරලා පද්මසේකරට කුමාර සුරවීර ගේ දැවැන්ත ඓතිහාසික සිනමාපටයේ ප්‍රධාන චරිතය ලැබී ඇති බව නිරාශා කියැවූයේ “රිදී” සිනමා පුවත්පතින් ය. ඒ පුවත ඇගේ සිතේ සියුම් ඊර්ෂ්‍යාවක් ඇති කළේ ය.

ක්ෂේත්‍රයේ පතාක යෝධයකු වන කුමාර ගේ සිනමා පටයක රඟපාන්නට ලැබීම නිළියකට කලාතුරකින් ලැබෙන භාග්‍යයක් බව නිරාෂා දනියි. ඇය වඩාත් කැළඹිල්ලට පත් වූයේ මේ චරිතය සඳහා කුමාර මුලින්ම ආරාධනා කළේ තමාට වීම නිසා ය. තමා ප්‍රතික්ෂෙප කළ ඒ දුර්ලභ අවස්ථාව ක්ෂෙත්‍රයේ තමාට වඩා බොහෝ පහළින් සිටින ආධුනික නිළියකට ලැබීම ඇගේ සිත කැළඹීමට පත් කරන පුවතක් විය.

අතටම ලැබෙන මෙවන් අවස්ථා මගහරිමින් යන මේ ගමනේ කෙළවර දී තමා වල්මත් විය හැකිය යන බියක් නිරාශා ගේ සිතේ ඇතිවෙයි. රංගනය නවතන්නට කියා හෝ දිගටම කරගෙන යන්න කියා හෝ කිසිදු බලපෑමක් විදුල නොකළ බව සැබෑ ය. මේ සියලු තීරණ වල වගකීම තමාගේ ම බව නිරාශා දනියි. මෙවැනි ස්ථාවරයක සිටීමේ තේරුමක් තිබේ ද?

කුමාර ගේ සිනමාපටයේ චරිතය වෙනුවෙන් නිරාශාට ගෙවන්නට යෝජනා වූ මුදල විශාල එකක් විය. මේ තරම් ආර්ථික අපහසුකම් වලින් පීඩිතව සිටියදී එතරම් විශාල මුදලක් ප්‍රතික්ෂෙප කිරීම කොයිතරම් අනුවණ කුමක්දැයි දැන් ඇයට සිතෙයි.

ප්‍රතිභාපූර්ණ චරිතාංග නිළියක ලෙස තමා ගොඩ නගා ගෙන තිබූ ස්ථාවරය ක්‍රමයෙන් ගිළිහී යන සෙයක් නිරාෂා ට දැනෙයි. රංගනය ආත්මයයි. මේ දියකර හරිමින් සිටින්නේ තමාගේ ආත්මය නොවේදැයි ඇය මොහොතකට සිතුවා ය.







අන්ධකාර ගුහාවකට වැදුණාක් සේ සියල්ලෙන් ඈත්ව, විදුල හා සමීපයේ සිටීමේ සුවය පමණක් විඳ ගැනීමෙන් තමාට සෑහීමකට පත්විය හැකිද යන පසුගිය කාලය පුරාම සිතට වද දුන් පැනය නැවතත් ඇගේ සිත මතුපිටට පැමිණ හොල්මන් කරනු ඇයට දැනෙයි. එය විසල් බරකි. විදුල කෙරෙහි බැඳි ආදරය නම් වන හුයෙන් මේ බර කෙතරම් කලක් දරා සිටිය හැකි වේද යන පැනයට නිසි පිළිතුරක් ඇය නොදත්තා ය. දිනෙක ඒ හුය කැඩී ගියහොත් තමා ඇදවැටෙන්නේ ඇදහිය නොහැකි තරම් බැරෑරුම් වියවුලකට නොවේදැයි ඈ සිතුවා ය.

බොහෝ වේලාවක් කල්පනා කරමින් සිටි නිරාශා දුරකතනය අතට ගත්තා ය. දෙවතාවක් නොසිතාම රිදී පුවත්පතේ ප්‍රධාන සංස්කාරකවරයා ගේ අංකය එබුවා ය.

මතු සම්බන්ධයි




# 24 Hours to Live.... What would you do?

What if you had only 24 hours left on this earth
I bet you would treasure it with all your heart
You would have to make the best out of the time you have hat hand
Because it is as small as a grain of sand
Do things that make you smile
It could be big as seeing the Nile
Maybe it surrounding yourself with the things you like
For example your favourite video game and you bike
Tell your loved ones about how much you care
And all the pleasant stories you will share

There are a lot of things that we want to do and get out of life, but if you had only 24 hours to live what would you do during your last moments on earth? Would you do something that you always wanted to do and may be at the top of your life long bucket list? Maybe you would do what you enjoy doing the most for the whole 24 hours. Most people will remind their friends and family of how much they love them and might decide just to spend their 24 surrounded by the ones they love. If you 24 hours to live I'm sure that you will not let a minute go to waste.

Most people have one major thing that they hope one day they will have a chance to do. For example I hope that I will have a chance to go sky diving. So if you have 24 hours to live why wouldn't you do that one thing that you write at the top of your bucket list? Wouldn't you step outside your comfort zone and do something that you wanted to do all your life. It could be something as small as learning something that you have been wanting to learn all your life to something as challenging as climbing the tallest mountain. As most people say you have not really lived until you take that leap that forms your day from ordinary to extraordinary, so there is no better time to take that leap and know that you had an extraordinary moment.



What do you enjoy the most? Is it that video game that you cannot stop playing until you finish all the levels? Or is that cake that you cannot get enough of. Why not surround yourself with the things that you love during the last 24 hours and enjoy every moment doing your favourite things? You can never regret your last moments then because you know that you invested every second in something that makes you smile. For example if I had to pick something that I really enjoyed doing I would pick travelling and visit as much places as I can with the people that are most important to me. Then there is no reason to regret my last 24 hours because I know that I did something that makes me happy.

People will miss their favourite show, food or game once their 24 hours are over, but what about those people that have been with you through every day both good and bad, so why wouldn't they experience your last day with you to? I would surround myself with the people that I love the most and make sure that I enjoy every moment with them. Have a laugh with your friends and talk about all those good moments that you had with each other. You do not want to forget

I could not imagine what I would do if I only had 24 hours to live. I would most probably spend it with my family and friends while travelling to the places that make me the most happiest and making sure to try something that I always wanted to do. Even if it is something as little as trying a new food to exploring some place that I have never heard of before.

If most people were asked the question what would you if you only had 24 hours to live. They would say that they would make the most out of it by trying something that they usually would not do, or they would do something that they know makes them happy. Spending time with the people that mean the most to you are usually a priority in everyone's list. But no matter what I know that if I only had 24 hours to live I will not waste a single second and make the best of every moment because I want to make sure that they are the best 24 hours.










